**ප්‍රශංසා එකතු සුපුවත**
**2018 අගෝස්තු මස 06 වන දින සිට අගෝස්තු මස 12 වන දින දක්වා**

**"දේව වචනය, දේව කැමැත්ත සෙවීමට 'මා අනුව එන්න' යනුවෙන් ජේසු සමිඳාණෝ ඇරයුම් කරන සේක."**

01. ප්‍රශංසාවට හැඳින්වීම :

* පුබුදු ගී අංක 01 "පිය පුත් සුදතුම් සමිඳුට විශ්වයේ ...."

* මේ වසරේ අපගේ වාර්ෂික තේමාව " ඔබ වහන්සේගේ වචනය ද කැමැත්ත ද ගින්නකි;ආශිර්වාදයකි " යන්නයි. ඔවුන් වහන්සේගේ වචනය ගින්නක්. ඔවුන් වහන්සේගේ කැමැත්ත ගින්නක්. ඒ වාගේම වචනයත්, කැමැත්තත් ආශිර්වාදයක්.

* "මාගේ භෝජනය නම්, මා එවූ තැනැන් වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමත්, ඔවුන් වහන්සේගේ කාර්යය නිමාවට පත් කිරීමත්ය." (ශු. ජොහාන් 4:34) ක්‍රිස්තුන් වහන්සේගේ භෝජනය හෙවත් ජීවිතය වූයේ දෙවි පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමයි. එය මුළු විශ්වයටම ආශිර්වාදයක් වූවා.

* "....ජේසුස් වහන්සේ දෙසම නෙත් යොමා, අපට දිවීමට ඇති ධාවනය නොපසුබට, වීර්යයෙන් දුවමු..." (හෙබ්‍රෙව් 12:2) දෙවි පියාණන් වෙතට යන්නට මාර්ගය ක්‍රිස්තුන් වහන්සේයි. ක්‍රිස්තුන් වහන්සේ වෙතට, අප ගෙන යන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේයි. අපි ශුද්ධවූ ත්‍රිත්වීයක වූ දෙවියන් වහන්සේ අභිමුව පෙනී සිටිමින් ඔවුන් වහන්සේට අපගේ ප්‍රශංසාව, ස්තුතිය, නමස්කාරය පුද කරමු.

* පුබුදු ගී අංක 137 "ඔබගෙ වචනයෙ දාසියයි මා... "

02. පසුගිය සතියේ සුපුවත මුල් කරගෙන අත්දැකීම් බෙදා ගැනීම....

03. දවසේ සුපුවත :

* ශු. ජොහාන් 5:30 සහ හිතෝපදේශ 29:18 පොදුවේ ප්‍රකාශ කරන්න.

* කුඩා සංඝ ලෙස වෙන්වී නැවත මෙම පාඨයන් කියවා මේ පිළිබඳව සාංඝික කර ගනිමු.

* ඉන්පසු කුඩා සංඝ කිහිපයක අත්දැකීම් පොදුවේ සාඝික කර ගනිමු.

04. අනාවරණය අයිතිකර ගනිමු :

* **ශු. ජොහාන් 5:30**

  **ඔවුන් වහන්සේගේ ජීවිත අරමුණ, දැක්ම වූයේ දෙවි පියාණන්ගේ කැමැත්ත ඉටුකිරීමය "මන්ද මාගේ අරමුණ, මාගේම කැමැත්ත ඉටු කිරීම නොව, මා එවා වදාළ ඔවුන් වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමය"**

* හිතෝපදේශ 29:18

  **"ජීවිත දර්ශනයක් නැති තැන විනයක් නැත. විනය රක්නා අය වාසනාවන්තය." ජීවිතයට අරමුණක් දර්ශනයක් නැති මිනිසා හිතුවක්කාරයි. ඔහු ඔහුට ඕන ඕන දේවල් කරන්නෙ. එහෙත්, ජේසු සමිඳාණෝ ඔවුන් වහන්සේට ඕන ඕන දේවල් කළේ නෑ. ඔවුන් වහන්සේට අරමුණක් තිබුණා. ඒ අරමුණ තමයි, තාත්තාගේ කැමැත්ත ඉටු කිරීම. ඒ අරමුණෙන් පිට ඔවුන් වහන්සේ කිසිවක් කළේ නෑ. ඔවුන් වහන්සේ කළ දේ, සිතූ දේ, කියූ දේ සියල්ල කළේ තාත්තාගේ කැමැත්තට අනුකූලවයි.**

* ජේසු සමිඳාණන් හට එසේ කරන්නට හැකි වූ බලය ලැබුණේ කෙසේද?ශුද්ධාත්මයාණන් වහන්සේට බද්ධ වූ නිරන්තර අවදි වීමේ අත්දැකීමත්, නිරන්තරයෙන් අබ්බා පියාණන් අභිමුව පෙනී සිටීමේ ගැඹුරු යාච්ඤාවේ ජීවිත අත්දැකීමත් නිසයි.

* ඒ සමගම ඔවුන් වහන්සේ ශුද්ධ ලියවිල්ල තුළින් ආ දේව වචනය තුළ අනාවරණය වූ දේව කැමැත්තට සෘජුවම අවදි වූසේක. ඒ වචනය තුළ ලද අනාවරණයට (දේව කැමැත්තට) අනුකූලව ජීවත් වූ සේක.

05. අප දෙසට :

* "මා අනුව එන්න!" යනුවෙන් ඔවුන් වහන්සේ අපට ඇරයුම් කරන්නේ, ඔවුන් වහන්සේ මෙන් දිවි ගෙවීමටයි. ඒ අයුරින් තාත්තාගේ කැමැත්ත ඉටු කිරීමටයි. අප කෙතෙක් දුරට සමිඳුන් වෙතම නෙත් යොමු කරගෙන ජීවත් වෙනවාද?
  ළඟ සිටින කෙනෙක් සමඟ බෙදා ගන්න.

* අප කොතෙක් දුරට අපේ පෞද්ගලික ජීවිතය තුළ, අපේ පවුල තුළ, අපේ සංඝය තුළ දේව කැමැත්ත විමසා ඊට අනුකූලව ක්‍රියා කරනවාද? බෙදා ගන්න.

* ශුද්ධාත්මයාණන් වහන්සේට අවදි වීමේ ජීවිතය, යාච්ඤාවේ ජීවිතය, ශුද්ධවූ බයිබලය තුළ දේව වචනය තුළින් දේව කැමැත්ත හඳුනා ගන්නට කෙතරම් දුරට උපකාරී වී තිබෙනවාද? බෙදාගන්න.

06. අවසන් ප්‍රශංසාව :

* සියල්ලේ දී දේව කැමැත්ත සොයා එය ඉටු කිරීමට, ඒ සඳහා ශුද්ධාත්මයාණන්ට නිරන්තර අවදිවීමට, සැමදා දේව වචනය අනුභව කිරීමට, ගැඹුරු යාච්ඤාවේ දිවියක් ගත කිරීමට අවශ්‍ය බලය පතා කුඩා සංඝ ලෙස එක් එක්කෙනා වෙනුවෙන් යාච්ඤා කරමු.

* පවුල තුළ, එදිනෙදා හමුවන අය හමුවේ දේව වචනය සෙවීම, දේව කැමැත්ත ඉටු කිරීම පිළිබඳව අවදි වෙමු. අවදි කරමු.

  පුබුදු ගී අංක 221 "ජේසුනී සමිඳේ ..."

=====================

**ප්‍රශංසා එකතු සුපුවත**

**2018 අගෝස්තු මස 13 වන දින සිට අගෝස්තු මස 19 වන දින දක්වා**

**පෞද්ගලිකව හා පවුලක් වශයෙන් දෙවියන් වහන්සේගේ වචනය සොයමු.**

01.ප්‍රශංසාව සඳහා යැදුම :

* ධර්මයාණන් කනින් ඇසීම, ඇස්වලින් දැකීම, දැකබලා අත්වලින් ස්පර්ශ කිරීම පිළිබඳව ශු.ජොහාන් තුමා සාක්ෂි දරයි. (ශු.ජොහාන් 1:1-2)
* වාක්‍යයාණන් මාංශගත වූ සේක. අප සමගද වාසය කළ සේක. ක්‍රිස්තියානි සුභාරංචිය මෙයයි. ප්‍රශංසාව තුළ මරණය ජය ගෙන අප අතර වැඩ සිටින ජීවනයේ සමිඳාණන්ව හමු වීමේ භාග්‍ය අපට ලැබී ඇත. ඔවුන් වහන්සේගේ වචනයට සවන් දීමේ වරම ප්‍රසාද ස්නාපනීය කැඳවීම මඟින් අපට උරුම වී ඇත. එබැවින් ප්‍රශංසා එකතුව ඔබට, මට ලැබී ඇත් අගනා ත්‍යාග්‍යකි. මේ මොහොතේ සමිඳාණන් වහන්සේට අපගේ වන්දනාව, නමස්කාරය පුද කරමු. තුති ගී ගයමු. ඔවුන් වහන්සේගේ ප්‍රේමයේ ස්පර්ශය ලබමු.
* පුබුදු ගී අංක 188 " වචනයාණනි......ශ්‍රී වචනයාණනි"

02. පසුගිය සතිය පුරා දේව වචනය මුල් කරගෙන, විවිධ අයුරින් අප ලද අත්දැකීම් පොදුවේ සාංඝික කර ගනිමින්, සමිඳාණන්ට මොහොතක් තුති ප්‍රශංසා කරමු.

03. සුපුවත :

මෙම වසරේ ශුද්ධාත්ම මංගලෝත්සවයත් සමගම දේව වචනය සෙවීමේ ඇතුලාන්ත පිපාසයක් ඔබ තුළ ජනිත වී තිබේද? පහත දැක්වෙන අයුරින් කුඩා කණ්ඩායම් තුළ මේ පිළිබඳව බෙදා ගනිමු.

**i** සැම විටම, සැම තැනම දේව වචනයට විවෘත වන්නට පෞද්ගලිකව මෙන්ම පවුලක් ලෙස පිපාසයක් තිබේද? අවදි වීමක් තිබේද?

**ii** පෞද්ගලික ජීවිතය තුළ හෝ පවුල් පරිසරය තුළ දේව වචනයට විවෘත වීමෙන් ඔබ ලද අත්දැකීමක් කෙටියෙන් බෙදාගන්න.

04.සුපුවත: පෞද්ගලික මෙන්ම පවුලක් ලෙස දේව වචනයට විවෘත වෙන්නට නම්......

**i** නිරන්තරයෙන්ම ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ හැසිරීම, පැවතීම, ජීවත්වීම අත්‍යවශ්‍ය කාරණාවක් බව ශු. බයිබලයේ සහතික කරයි.

* 1 සාමුවෙල් 10:9-10 " දෙවියන් වහන්සේගේ ආත්මානුභාවය ඔහුට ආරුඪ විය.එවිට ඔහු ඔවුන් සමග ධර්ම වාක්‍ය පැවසුවේය."

* ශු. ලූක් 1:35 " ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පහල වන සේක. පරමෝත්තමයාණන්ගේ ආනුභාවය ද ඔබ වසා ගන්නේය.එහෙයින් උපදින දරුවා පුත්‍රයාණෝයයි කියනු ලබන සේක."

**ii** උපවාසය මෙන්ම ධ්‍යානශීලී යාච්ඤාව දේව හඬ ශ්‍රවණය කරන්නට සුවිශේෂී වූ මාධ්‍යයකි.

* ක්‍රියා 22:17-21 මම දේව මාළිගාවේදී ධ්‍යානශීලීව යාච්ඤා කරමින් සිටියදී දර්ශනයක් දුටිමි. එවිට ඔවුන් වහනසේ කතා කොට "යන්න මම ඔබ බොහෝ ඈත විජාතීන් වෙත යවන්නෙමි" යි වදාළ සේක.

**iii** මනස්ථාපනයේ යතුර නිරතුරුවම දකුණත තබා ගනිමු.

* ක්‍රියා 22:14-16 - දෙවියන් වහනසේ තමන් වහන්සේගේ කැමැත්ත දැන ගන්නටත්, ධර්මිෂ්ඨයාණන් දකින්නටත් ඔවුන් වහන්සේගේ මුඛයෙන් වචන අසන්නටත් ඔබ තෝරා ගත් සේක. නැගිට යාච්ඤා කරමින් බෞතිස්ම ස්නාපනය ලැබ ඔබේ පව් සෝදා හරින්න.

**iv** එකිනෙකා සමඟ ගැඹුරු එකමුතුකමක් මෙන්ම, සාංඝික වීම මගින්

* ශු.මතෙව් 18:19-20 "මන්ද, යම් තැනක දෙදෙනෙක් හෝ තුන් දෙනෙක් මාගේ නාමයෙන් රැස්ව සිටිත්ද එතැන ඔවුන් මැද මමත් වැඩ සිටිමි."

**v** දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ කේන්ද්‍රීය කරගත් ජීවිත පැවැත්ම ඉතා වැදගත්ය.

* ක්‍රියා 2:42 - ඔවුහු ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීමෙහි ද,සහභාගිකමෙහි ද, රොටී කැඩීමෙහිද, යාච්ඤාවෙහි ද, නිරතව කල්ගත කළහ.

**vi** දේව කැමැත්ත ඉටු කිරීමේ අරමුණ අපගේ ප්‍රමුඛතාවයයි.

* ශු.ජොහාන් 14:21 - මාගේ ආඥා පිළිගෙන ඒවා පිළිපදින යමෙක් වේද......මම ද ඔහුට ප්‍රේම කොට ඔහුට එළිදරව් වන්නෙමි.''

05. අත්දැකීමක්:

මාගේ බිරිඳට හදිසියේම තදබල ලෙස අසනීප වුනා. වෛද්‍ය නිර්දේශයට අනුව ස්කෑන් පරීක්ෂනයේදී සොයා ගනු ලැබුවේ වකුගඩුවේ සිට නාලයකට ගලක් ඇතුළු වී සිරවී තිබෙන බවයි. මේ පිලිබඳව නොදැන සිටි නිසා මෙම තත්ත්වය මුල් කරගෙන මාස 02 කට ආසන්න කාලයක් තදබල ලෙස වේදනා වින්දා. එසේම වෛද්‍යවරයා ප්‍රකාශ කළේ නොපමාව ශෛල්‍ය කර්මයක් මගින් ඉවත් කළ යුතු බවයි. ඒ සඳහා ලක්ෂ 3 පමණ මුදලක් වැය වන බවද කියා සිටියා. මේ තත්ත්වය ඉදිරියේ සමිඳාණන් වහන්සේගේ කැමැත්ත කුමක්දැයි අපට එළිදරව් කරන මෙන් එදින සිට දින 07 ක් පුරා නොකඩවා සංඝයේ කීප දෙනෙකු එකතු වී යාච්ඤා කළා. 07 වන දවසේදී රාත්‍රී යාච්ඤාව තුළ බලාපොරොත්තු නොවූ අයුරින් එම ගල නාලයෙන් ඉවත් වුනා. එසේ කරන බවට සමිඳාණන් වහන්සේ අපට වචනයක් දුන්නා.

06. අවසාන ප්‍රශංසාව

* සමිඳාණන් වහන්සේගේ වචනය සොයන්නට, වචනය තුළ ජීවත් වන්නට වරම් ලද අප මෙලෙස තව තවත් වචනයට විවෘත වීමට බලය පතා යදිමු.

* පුබුදු ගී අංක 188 " වචනයාණනි..... ශ්‍රී වචනයාණනි"

========================

**ප්‍රශංසා එකතු සුපුවත**

**2018 අගෝස්තු මස 20 වන දින සිට අගෝස්තු මස 26 වන දින දක්වා**

**"දෙවියන් වහන්සේට අයිති වූවන් ඔවුන් වහන්සේගේ වචනය තුළම ජීවත් වන්නහුය"**

01. ආරම්භක ප්‍රශංසාව :

පුබුදු ගී අංක 03 "ආ එනු මැනේ..."

ප්‍රශංසාවට හැඳින්වීම : **"දේවාත්මයාණන් විසින් මඟපෙන්වනු ලබන්නෝ දෙවියන් වහන්සේගේ පුත්‍රයෝය."** (රෝම 8:14)

දේව වචනයට විවෘත වන්නට ද, දේව කැමැත්තට ඉඩදිය හැක්කේ ද ආත්මයාණන් වහන්සේ තුළ ජීවත් වන කෙනෙකුටය. එදිනෙදා ජීවිතයේ අප මුහුණ දෙන විවිධ වූ සිදුවීම් හරහා අපට ලැබෙන දෙවියන් වහන්සේගේ වචනයට සවන් දෙන්නට, විවෘත වන්නට, එය අයිති කර ගන්නට ද ඒ තුළින් අනාවරණය වන දේව කැමැත්ත දැන ගන්නට ද ශුද්ධාත්මාණන්ට අවදිවීමේ ජීවිතයක් ගත කිරීම අති අවශ්‍යයය. ගැඹුරු යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීම ඊටත් වඩා අවශ්‍යයය. පිබිදුනු කිතුනුන් ලෙස ඔබට /මට ඒ සඳහා ලැබී ඇති වරප්‍රසාද ඉමහත්ය. ඒ වෙනුවෙන් අපි දෙවියන් වහන්සේට ප්‍රශංසා කළ යුතුමය. අප තුළ නැවතී වැඩ වසන ශුද්ධාත්මාණන් වහන්සේට ඉඩ දෙමින් අද දවසේ ප්‍රශංසාවට ඇතුළු වෙමු.

පුබුදු ගී අංක 103 "තුති ප්‍රශංසා වේ...."

02. ආපසු බැලීම :

* පසුගිය සතිය පුරා එදිනෙදා ජීවිත සිදුවීම් තුළ පුද්ගලයෙක් ලෙස, පවුලක් ලෙස වචනය සොයන්නට ඔබට හැකිවීද?

03. දවසේ සුපුවත : **"දෙවියන් වහන්සේට අයිති වූවන් ඔවුන් වහන්සේගේ චනය තුළම ජීවත් වන්නහුය."**

* ඔබ ලෝකයේ සිටියත් ලෝකයට අයිති නැත"
* ලෝකයෙන් වෙන් කොට මට දුන් මිනිසුන් හට ඔබගේ නාමය මම ප්‍රකාශ කරමි. ඔවුහු ඔබට අයිතිය. (ශු.ජොහාන් 17:6)

* ක්‍රිස්තුන් වහන්සේ තුළ පැවති ජීවිත ආකල්පය ඔබ තුළත් පවතීවා (පිලිප්පි 2:5)
* එහෙත් දෙවියන් වහන්සේගේ ආත්මයාණෝ සැබවින්ම ඔබ තුළ වාසය කරන සේක් නම් ඔබ ජීවත් වන්නේ මාංශික තෘෂ්ණාවල නොව ආත්මයාණන් තුළය. යම් කෙනෙකුට ක්‍රිස්තුන් වහන්සේගේ ආත්මයාණන් නැත්නම් , ඔහු ඔවුන් වහන්සේට අයති නැත. (රෝම 8:9)

ඉහත සඳහන් ශුද්ධ බයිබලීය පාඨ හරහා අපට ලැබී ඇති ජීවිතය ඔවුන් වහන්සේ හා බැඳී ඔවුන් වහන්සේටම අයිති ජීවිතයක් බව අපට පැහැදිලි වේ. එසේ නම් අපගේ ජීවිත පැවැත්ම ඊට අනුකූල විය යුතුය. පසුගිය සති දෙක තුළ දෙවියන් වහන්සේගේ වචනය සෙවීම පිළිබඳ මනා අවබෝධයක් අප තුළ ගොඩ නැගුණි. පුද්ගලයෙකු ලෙස, පවුලක් ලෙස දේව වචනය සෙවීමේ පිපාසය අප තුළ වර්ධනය විය. ඉනුත් ඔබ්බට ප්‍රමුඛතාවයන් දෙකක් ගැටෙන විට වචනය සෙවීම පිළිබඳව අපි අවදි වෙමු.
මනුෂ්‍ය පෙළඹවීම අපගේ කැමැත්ත ඉටුකර ගැනීමටය. නමුත් දේව කැමැත්ත ඊට වෙනස්ය. ප්‍රමුඛතාවයන් දෙකක් එකම මොහොතක ඉටු කිරීමට සිදු වීමේදී අප තුළ ප්‍රශ්නයක් මතු වෙයි. 'මින් මා කළයුත්තේ කුමක්ද? ' ඒ සඳහා ,

1. ශුද්ධාත්මයාණන්ට අවදි වෙමින් වසා ගන්නට ඉඩ දෙමි.
2. ශුද්ධාත්මයාණන් වහන්සේගේ හඬට සවන් දෙමි.
3. හඬ තුළින් එන වචනයට විවෘතව සිටිමි.
4. ඊට තනිව පිළිතුරු සොයාගත නොහැකි හෙයින් ඊට මඟපෙන්වීමක් ලබමි.
   * එඬේරා සමඟ බෙදා ගැනීම
   * සංඝයේ ශ්‍රේෂ්ඨයකු සමඟ බෙදා ගැනීම

අත්දැකීමක් : ප්‍රමුඛතාවයන් දෙකක් ගැටුනු මොහොතක වචනය සෙවීමෙන් ලද ආශිර්වාදයකි. පියෙකුට දිනක් තම භාර්යාව සමග අක්ෂි සායනයකට යාමට සිදුවූයේ භාරකරුවකු එම කාර්යය සඳහා අනිවාර්ය බැවිනි. එදිනම යාච්ඤා මෙහෙයක භාරකරු ලෙසද එම ස්ථානයට

මෙම පියා යා යුතුව තිබිණි. ප්‍රමුඛතාවයන් දෙකක් ලෙස මෙම අවස්ථාවන් දෙකම සැලකූ පියා උදේ වරුවේ අක්ෂි සායනයටත්, සවස් වරුවේ යාච්ඤා මෙහෙයටත් සහභාගී වීමේ බලාපොරොත්තුවෙන් නිවසින් පිට විය. අක්ෂි සායනය තුළදී ඔවුනට ලැබුනු අංකය 89යි. එම අංකය සඳහා ලැබෙන වෙලාව සවස් වන බව ඔවුනට දැණිනි. යාච්ඤා මෙහෙය සඳහාද සවස 04.30 වන විට සිටිය යුතුය. කෙමෙන් කාලය ගෙවී ගියේය. ප්‍රමුඛතාවයන් දෙක තුළ ගැටෙන පියා ශුද්ධාත්මයාණන්ට අවදි විය. ඔවුන් වහන්සේට ඉඩ දෙමින් යාච්ඤාවේ යෙදුණි. මනුෂ්‍ය උත්සාහයන් කිහිපයක් ගත් නමුත් ඒ සියල්ල අසාර්ථක විය. නැවතත් යාච්ඤාවේ යෙදී සිටිමින්ම සිය භාර්යාව වෙත ගියේය. ඒ මොහොතේ අක්ෂි සායනය භාරව සිටි හෙදි නිලධාරිනියගේ ප්‍රධාන පාලක තුමිය එතනට පැමිණ මෙම පියාගේ පිටට තට්ටු කරමින් ඔබේ අංකය කීයදැයි ඇසීය. 89 යැයි පිළිතුරු දුන් පියාගේ අතින් පොත රැගෙන ගිය හෙදිය ඒ මොහොතේම වෛද්‍යවරයා වෙත භාර්යාව යොමු කළේය. සවස 04.30 වන විටම යාච්ඤා මෙහෙය සඳහා යාමට පියාට හැකි විය.

04. ප්‍රායෝගිකව : (ළඟ සිටින කෙනෙකු සමඟ බෙදා ගන්න)

* මෙලෙස වචනය සොයන්නට ඔබ තුළ අවදිවීමක් තිබේද?
* එවැනි අත්දැකීම් ඔබත් අත්දැක තිබේද?

05. සතිය පුරා :

දෙවියන් වහන්සේට අයිති වූවන් ලෙස ජීවත් වන්නට කැඳවීම ලැබූවකු ලෙස හැම මොහොතකම දේව වචනයට විවෘත වෙමින්, දේව සිත විමසමින් ක්‍රියා කරන්නට අවදි වෙමු.

06. අවසන් ප්‍රශංසාව :

මෙන්න මම එමි, ඔබගේ කැමැත්ත ඉටු කරන්නට
කුමක්ද කියා අසන්නට, නිතර නිතරම අසන්නට
පෙළඹුව මැනවි මා දෙව් පියාණෙනි

============================

**ප්‍රශංසා එකතු සුපුවත**

**2018 අගෝස්තු මස 27 වන දින සිට සැප්තැම්බර් මස 01 වන දින දක්වා**

**දේව වචනයට, කැමැත්තට කීකරුවීම හා අවනත වීම**

01. ආරම්භක ගීතිකාව : පුබුදු ගී අංක 185 "ඔබ හා පිය නඟනා මම වෙමි දෙව් සමිඳා..."

02. ප්‍රශංසාවට යොමුව :

* පසුගිය සතියේ අප භාවනා කළා දෙවියන් වහන්සේගේ වචනය, කැමැත්ත සෙවීමේදී අපට වචන දෙකක් හෝ වැඩි ගණනක් ලැබුනු බව අප දේව කැමැත්ත සොයා ගන්නේ කෙසේද කියලා එවන් අවස්ථාවලදී අපගේ ආධ්‍යාත්මික ජීවිත ගමනට අත දෙන එඬේරාගේ සහය ලබා ගැනීම හෝ වැඩිහිටියෙකුගේ, සහා ශ්‍රේෂ්ඨයකුගේ උදව්ව ලබා ගත යුත්තේ කෙසේද කියා .
* එසේ ක්‍රියා කිරීමේදී අපට ලැබෙන වචනය ඇවිලෙන ගින්නක් වුවද, එය අපගේම ජීවිතවලට ආශිර්වාදයක් වෙනවා. එසේ දේව සිත විමසමින් ජීවත් වීමට ලැබීම මොන තරම් වාසනාවක්ද? මෙම තත්ත්වය නොදන්නා ලෝකයේ ජීවත් වන අය, ඔවුන්ගේ ජීවිත අවුල් කරගෙන ඇති අවස්ථා කොපමණද? අපට ලැබී ඇති මේ ආශිර්වාදාත්මක ජීවිතය ගැන, අප හා නිරන්තරයෙන්ම වැඩ සිටින ශුද්ධාත්මයාණන් සමඟින් ප්‍රශංසා කරමු.
* පුබුදු ගී අංක 49 "යන්න සැරසෙමු දැන්ම ලොවටා...."

03. සතියේ සුපුවත :

* දෙවියන් වහන්සේ තමන් ප්‍රේම කරන සියල්ලන්ට සිය කැමැත්ත අනාවරණය කරන සේක. එයට කීකරු වීමට, අවනත වීමට, භාර ගැනීමට ඔවුන් වහන්සේ කිසිවකුට බලපෑම් කරන්නේ නැත. සිය පූර්ණ කැමැත්තෙන් එය භාර ගැනීම, පිළිපැදීම අප සතුවූවකි. එයට අවනත වීමට නම් බොහෝ විට අප තුළ වූ කැමැත්තට හා අදහස්වලට මරණයක් අත්විඳින්නට සිදුවේ. එය කලකිරීමකින් හෝ බලකරීමක් ලෙස නොව ඔවුන් වහන්සේට කීකරු වීමෙන් අප දක්වන්නාවූ ප්‍රේමය නිසාම සිදුවන්නක් විය යුතුය.

* ජෝර්දාන් නදියේදී සිය ප්‍රියාදර පුත්‍රයාණන් ලෙස තෝරාගත් සමිඳාණන්ට පියාණන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත වූ කුරුසියට නැගීමට කීකරු වීමට, ඒ නින්දිත මරණය වැළඳ ගැනීමට සිදු විය. සමිඳාණන් එය ඉටු කිරීමට අති කඨෝර වූ වේදනාවන්, මරණයන් වුවද පියාණන් වහන්සේට ඇති ප්‍රේමය නිසාම ඒ සියල්ල සතුටින් භාරගත් සේක. භාග්‍යවන්ත මාතාවන්ද දේව කැමැත්තට කීකරු වීමේදී දෙමාපියන්, විවාහ බස් දී සිටින ජුසේ තුමන්, නෑ හිතවතුන් පිනවීම නොව ඕනෑම වේදනාවක් විඳ දරා ගැනීමට සිය අවනතභාවය පල කරමින් "ඔබගේ කැමැත්ත මට සිදුවේවා"යි ප්‍රකාශ කරන්නීය.
* දේව වචනයට, කැමැත්තට කීකරු නොවීමේදී දෙවියන් වහන්සේ ක්‍රියා කළ ආකාරය අති භයානක බව පුරාණ ජනතාවගේ අත්දැකීම විය. එය අපට මැනවින් අවබෝධ කරගත හැකි අවස්ථා (වචනයේ සේවකයා කලින් සූදානම් වී ඉදිරිපත් කරන්න)

    i ශීන් නම් පාළුකරයේ මෙරිබා නම් ස්ථානයේදී ජනතාව ජලය ලබා දීමට මෝසස්ට පර්වතයට සැරයටියෙන් පාරක් ගැසීමට දෙවියන් වහන්සේ කළ නියමය සැකයට භාජනය කරමින් දෙවරක් එයට ගැසීම හේතුවෙන් දෙවියන් වහන්සේ මෝසෙස්ට පොරොන්දු දේශයට පා තැබීම අහිමි කිරීම. (ද්.නී.ස. 32:48-51)
    ii කැරලිකාර ඊශ්‍රායෙල් ජනතාව දෙවියන් වහන්සේට කීකරු නොවී අකීකරු ක්‍රියා කිරීම නිසා ජෙරමියා දිවැසිවරයා ලවා ඔවුනට පැමිණවීමට නියමිත දඬුවම (ජෙරමියා 6:19-21)
    iii දෙවියන් වහන්සේගේ නියමයන්ට සවන් නොදී අකීකරු වූ ජනතාවට ඔවුන් වහන්සේගේ උදහස පමුණුවන ආකාරය ලෙවී ව්‍යවස්ථාවේ සඳහන් කර ඇති අයුරු (ලෙවී ව්‍යවස්ථාව 26:14-18)

අත්දැකීමක් :

පසුගිය වසරේ අගෝස්තු මඩු මංගල්‍යය සඳහා පවුලක් ලෙසින් සැම දෙන එක්ව යෑමට සූදානම් වූයෙමු. නියමිත දින නිවසින් පිටත් වීමට සියළු භාණ්ඩ හා වාහන සූදානම් කර බලා සිටියේ ගමනට එක්වීමට අපගේ පුතා ඇතුළු පවුලේ අයගේ පැමිණීමයි. ප්‍රමාද වී ඔහු ප්‍රකාශ කළේ සිය සිඟිති පුතා හදිසියේ අසනීපවී නේවාසිකව වෛද්‍ය ප්‍රතිකාර ලබා දෙන බවත්, වෛද්‍යවරුන් දරුවා විවේකීව තැබීමටත්, දින කිහිපයක් රෝහලේ නවතා තබා ගතයුතු යැයි දැන්වූ බවත්ය. මෙම සිදුවීම හමුවේ අප පවුලේ සැම එක්ව යාච්ඤා කර දෙවියන් වහන්සේගේ කැමැත්ත විමසීමේදී අපට ලැබුණ වචනය වූයේ එම ගමන නවතා දමන ලෙසය. එය භාර ගතිමු. පසුදින අළුයම රෝහල වෙත ගොස් සිඟිති පුතාගේ සුවදුක් බලන විට අප දුටුවේ ඔහුගේ තත්ත්වය ඉතා යහපත් තත්ත්වයකට පත්ව ඇති බවය. මගේ පුතා ප්‍රකාශ කළේ දැන් තත්ත්වය යහපත් නිසා අපට යොදා ගත් වන්දනා ගමන යන ලෙසත්, ඔවුන් නතරවන බවත්ය. මේ යෝජනාවට දරුවන්ගේද එකඟතාවය පලවිනි. එදින මැදියම් රාත්‍රිය වන විට අප මඩු කඳවුරට ළඟා වූයෙමු. උදේ 10.00 පමණ වනවිට කූඩාරම් සකසා නිමකර , සෙසු අය ආහාර පිසින්නට විය. ඒ අවස්ථාවේදී තද සුළඟක් හා වැස්සක් ඇරඹිණි. එම තත්ත්වය පස්වරු 03.00 පමණ වනතුරු කිසිදු වෙනසක් නොවීය. සුළං අපගේ කූඩාරම් බිම නිදි කරවීය. ඇඳුම්, පැදුරු කොට්ට සියළු භාණ්ඩ මඩවලින් පිරී ගියේය. සියළු දෙනා සිටගත් තැන්වල පැය 5ක් පමණ සිටගෙන වැස්සෙන් නාන්නට විය. දෙව් මැදුරේ පියතුමා සවස 04.00ට ශබ්ද විකාශන තුළින් ප්‍රකාශ කළේ අයහපත් කාලගුණය නිසා මංගල්‍යය නොපැවැත්වෙන බවත්, සැමදෙන වෙත ආශිර්වාදය දානය කළ බවත්, හැකි කඩිනමින් කඳවුරෙන් පිටත්ව යන ලෙසත්ය. කරගත හැකි කිසිවක් නොමැති වූයෙන් මඩ තැවරුනු සියළු දෑ වාහනවලට පටවා ගෙන අපද ආපසු ගමන් ඇරඹුවෙමු. කිසිදු අනතුරක් සිදු නොවූ වාහනය අනතුරකට මගදී ලක්විනි. කෙසේ හෝ නිවසට පැමිණ දෙවිඳුන් හමුවට ගිය විට ලැබුණු වචනය වූයේ ඔවුන් වහන්සේගේ වචනය විමසා එය නොසලකා හැරීමේ අප කළ පාපය අත්විඳින්නට සිදු වූ බවය. පසුදා පහන් වනතුරු අප සමාව ඉල්ලා දෙවිඳුන් යැද්දෙමු.

* ඔබත් මෙවැනි අත්දැකීම් වලට ලක් වූයේ නම්, එය කුඩා කණ්ඩායම්වල සාංඝික කර ගන්න.

04. සතිය පුරා :

සෑම දිනකම උදෑසන දවස ඇරඹීමට පෙර දේව කැමැත්ත ඉටු කිරීමට තීරණයක් ගනිමු. එය දැනුවත්ව ඉටු කිරීමට ශුද්ධාත්මාණන් වහන්සේගේ වරම් පතමු. ලබන අත්දැකීම් සාංඝික කර ගනිමු

05. අවසන් ගීතිකාව - පුබුදු ගී අංක 131 "පුරා හදවතින් ...."

***************************